# තේරවිලි තෝරමු



මෙතුෂි උමාෂා රාජපක්ෂ

# තේරවිලි තෝරමු

ප්‍රථම එළි දැක්වීම 2023-11-15

ISBN 978-624-206-792-6

## මෙතුෂි උමාෂා රාජපක්ෂ







# පිදුම

‘අ’ යන්නේ සිට මා හට සිප් සතර

කියා දීමට වෙර දරණ

මාගේ දෙමව්පියන්ටත් පාසල් සෙවනේ

මා හට අකුරු කරන

මාගේ ආදරණීය ගුරු මෑණිවරුන්ටත්,

පියවරුන්ටත් මෙම

පොත ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# තේරවිලි

ගින්නක් නැතුව නගින දුම - මීදුම

කැලයේ නැති ඉන්න - යකඩ ඉන්න



ඔක්කොමගෙම මල්ලි - කොත්ත මල්ලි

ඔක්කොමගෙම අක්කා - වට්ටක්කා

තනි කකුලෙන් ඉන්න සුද්දා - හත්ත

අහසට දිග රිට - වැහි බින්දුව

ඔබේ සාක්කුවේ නොතිබිය යුතු දෙයකි - හිලක්

අගුරු කකා වතුර බිබී කොළඹ දුවන යකඩ යකා - දුම්රිය

දෙයියන්ගේ දුන්න - දේදුන්න

නැට්ට නැති කොළය - පත්තර කොළය

නැට්ට නැති ගෙඩිය - බිත්තර ගෙඩිය

ගහක් උඩින් මුවෙක් පැන්නා - කෙහෙල් මුව

කිසිම කෙනෙකු නොයා යුතු මග - නොමග



කාන්තාරයේ නැව - ඔටුවා

වඩු බාස් ලග තියෙන රට - බුරුමය

කටු නැති කැලේ ඇට නැති සතා - උකුණා

කිසිවෙකු නොකියවන පොත - ඉලපොත

ගස් වල නැති මල - කම්මල





ගහක් උඩ ගෙඩියක් ගෙඩියක් උඩ ගහක් - අන්නාසි

අතු අග පිපෙන ලිය - අරලිය

දවල් කනා - බකමූණා

වළලද්දි කොළ පාටයි ගොඩ ගද්දි කහ පාටයි - කෙසෙල් කැන

ගෙදර ඉන්න කිඹුලගේ මල්ලි - හූනා

ලේ කිව්වට රතුත් නෑ නා කිව්වට දළුත් නෑ - ලේනා

බෝතලේට දාන්න බැරි පැණි - කොම්පැණි

කන්න දෙනකොට ජීවත් වෙනවා වතුර දෙනකොට මැරෙනවා - ගින්දර

කන්නෙත් නෑ බොන්නෙත් නෑ ගෙදර දොරේ වැඩ කරනවා - යතුර

කාගෙත් අයියා - දහයියා

පුංචි ළිදේ වතුර රසයි - තැඹිලි

අලියා නොයන මග - ඉනිමග

කැලේට පාන - ගද පාන



අලියා නොකන දල්ල - ගිනි දැල්ල

සුදු මහත්තයා හොටු පෙරාගෙන - ඉටි පන්දම

සුදු මහත්තයා කළු තොප්පියක් දාගෙන - ගිනි කූර

වත්ත පහළ ළමයින් අඬවන්නා - කොච්චි කරල

බෙල්ලෙන් අල්ලලා මුල්ලෙන් තියනවා - හිරමනය







# තුන් තේරවිලි

රේප වතුර - රේප නම් කොම්බු , වතුර නම් ජලය = කොම්බු ජලය , ජම්බු කොළය

කෙලවර හපහපා - කෙලවර නම් කොණ , හපහපා නම් කකා = කොණ කකා , කණ කොකා

මෝඩ රුකුල් - මොඩ නම් ගොං , රුකුල් නම් අඩ = ගොං අඩ , අංගොඩ

සරුංගල් නූල - සරුංගල් නම් කයිට් , නූල නම් ලණුව = කයිට් ලණුව , ලයිට් කණුව

අහුර හූම් හූම් - අහුර නම් පිඩ , හූම් හූම් නම් බස්සා = පිඩ බස්සා , බඩ පිස්සා

වගේ වෙල - වගේ නම් වැනි , වෙල නම් වෙල් = වැනිවෙල් , වෙනිවැල්

පලතුරු තවාන - පලතුරු නම් බෙලි , තවාන නම් ගොල්ල = බෙලි ගොල්ල , ගොළු බෙල්ල

වග රිද්මය - වග නම් කරුණ , රිද්මය නම් තාලය = කරුණ තාලය , තරුණ කාලය

කාරිය බලන් - කාරිය නම් වැඩ , බලන් නම් බල = වැඩ බල , බඩ වැල

උදරයේ අසිපත් - උදරයේ නම් බඩේ , අසිපත් නම් කඩු = බඩේ කඩු , කඩේ බඩු

වස මැහි - වස නම් වහ , මැහි නම් මැස්ස = වහ මැස්ස , මහ වැස්ස

කෝකි කටුවා - කෝකි නම් කුක් , කටුවා නම් කට්ටා = කුක් කට්ටා , කක් කුට්ටා

රත්තරං වට - රත්තරං නම් රන් , වට නම් ගෝල = රන් ගෝල , ගොන් රාල

ආදි බින්දුව - ආදි නම් කල් , බින්දුව නම් පොද = කල් පොද , පොල් කද

පිලිකුල් කකුල - පිලිකුල් නම් ජරා , කකුල නම් පය = ජරා පය , පරා ජය

මහත්තයා වහලේ - මහත්තයා නම් සර් , වහලේ නම් පලය = සර්පලය , පාර්සලය

පවතින පුත්‍රයා - පවතින නම් පවත් , පුත්‍රයා නම් පුත් = පවත් පුත් , පුවත් පත්

කාලය පැවරීම - කාලය නම් කල් , පැවරීම නම් දෙනවා = කල් දෙනවා , දෙල් කනවා

රැකවල් පැසුනේ - රැකවල් නම් මුර , පැසුනේ නම් ඉදුනේ = මුර ඉදුනේ , ඉර මුදුනේ

පොළොව පැත්ත - පොළව නම් මිහි , පැත්ත නම් මිට = මිහි පිට , පිහි මිට







# තේරවිලි කවි

<u>කවිය</u>

සත් සමුදුරේ දිය පල්ලේ උපන්නේ

එම සමුදුරේ දිය මතුපිට පිපෙන්නේ

වැස්සට පිනි බබා නිතරම මෝරන්නේ

අද බැරිනම් මෙට තොරා එවන්නේ



<u>පිළිතුර</u>

සත් සමුදුරේ දිය පල්ලේ තිබෙයි අල

එම සමුදුරේ දිය මතුපිට තිබෙයි කොළ

වැස්සට පිනි බබා මෝරන කැකුළු මල

මත්සයින්ට මුතු කුඩයකි නෙළුම් මල

<u>කවිය</u>

සත් සමුදුරේ දිය පල්ලේ උපන්නේ

ඔළුව නැතිව කදමයි සාප දුන්නේ

නෙත් දෙක උඩ තියා බිම ගොදුරු කන්නේ

මෙතුන් පදේ තෝරාලා කියන්නේ



<u>පිළිතුර</u>

සත් සමුදුරේ දිය පල්ලේ උපන් සතා

ඔළුව නැතිව කදමයි සාප දුන් සතා

නෙත් දෙක උඩ තියා බිම ගොදුරු කන සතා

දැනගන් මිතුර කක්කුට්ටා නොවෙද සතා

**කවිය**

නෙත් දෙක විනා නෙත් බැල්මන් නැති   හේමා
පා දෙක විනා පා ගමනක් නැති   හේමා
මඩ බොර දියේ පණ රැක ගත්තා   හේමා
මෙතුන් පදේ තෝරන්නට බැරි   හේමා

**පිළිතුර**

වනන්තරේ ගල් උනු වෙනවා   හේමා
ගමේ කම්මලේ මිටියේ වැඩ   හේමා
මඩ බොර දියේ පණ රැකුනා   හේමා
මෙතුන් පදේ කීවේ ගිරයට   හේමා

**කවිය**

ගසට නමකි ගසමැරුනම වෙන නමකි
ගෙඩියට නමකි ගෙඩියේ සුඹුලට නමකි
මදයට නමකි මද කනකොට වෙන නමකි
මෙතුන් පදේ තෝරාලා කියන් සකි

**පිළිතුර**

ගසට ගොයම් ගස මැරුනම පිදුරු වෙති
ගෙඩියට වී පොත්තට දහයියා කියති
මදයට හාල් එය කනකොට බත් කියති
මෙතුන් පදය වී සදහා කියයි සකි

**කවිය**

ගසට නමකි මල පිපුනම වෙන නමකි
ගැටයට නමකි ලොකු වෙනකොට නමකි
ගෙඩියට නමකි ගෙඩි ඉදුනම වෙන නමකි
මෙතුන් පදේ තෝරාලා කියන් සකි

**පිළිතුර**

ගසට කොස් කියයි මලනම් පනා නොවේදෝ
ගැටයට පොලොස් ලොකු වෙනකොට නිකිනි නොවේදෝ
ගෙඩියට කොස් ඉදුනම වරකා නොවේදෝ
මෙතුන් පදේ තේරුවෙ මෙලෙස නොවේදෝ

**කවිය**

කුල වකුලන් මොන රනරත් කලක වෙතේ
හා මිරකෙක් වට කොලිගෙන් ඉඩ මහතේ
ගොටලු බැනෙක් බාරමයෙන් දූන පැවතේ
වූකි නානත් ගොල තයියා නොණ තකතේ

**පිළිතුර**

වලි කුකුලන් රණ මොනරත් වෙලක කතේ
මී හරකෙක් කොට වලිගෙන් මඩ ඉසතේ
බැටළු ගොනෙක් මාර බයෙන් පැන දුවතේ
නාකි වුනත් තලගොයියා තණ නොකතේ

කවිය

ටං ටං ගාන්නා තෝරා එවාපන්

ටිං ටිං ගාන්නා තෝරා එවාපන්

මග වැලි පිසින්නා තෝරා එවාපන්

දෙගම්බඩ රජා ගාන්නා තෝරා එවාපන්

පිළිතුර

ටං ටං ගාන්නා ගෝනා නොවේදෝ

ටිං ටිං ගාන්නා ලේනා නොවේදෝ

මග වැලි පිසින්නා කුකුළා නොවේදෝ

දෙගම්බඩ රජා ගාන්නා කිඹුලා නොවේදෝ

කවිය

ගස මුල කටු දෙකක් ආවයි  ජය ගන්ට

කද මැද තටු දෙකක් ආවයි ඉගිලෙන්ට

මුදුනත් මලක් පිපුනයි රුව විහිදෙන්ට

මෙතුන් පදේ තෝරාලා කියනු මෙට

පිළිතුර

ගස මුල කටු පොරකටු දෙක නේදෝ

කද මැද තටු ඉගිලෙනතටු නේදෝ

මුදුනත් පිපුනු මල කරමල නේදෝ

කුකුළා කියන එක දැන් හරි නේදෝ

<u>කවිය</u>

අලියා නොයන වල තෝරා කියන්නේ

අලියා නොයන දළු තෝරා කියන්නේ

අලියා නොයන මග තෝරා කියන්නේ

අලියා සදිසි ගල තෝරා කියන්නේ

<u>පිළිතුර</u>

අලියා නොයන වල මඩ වල නොවේදෝ

අලියා නොකන දළු ගිනි දළු නොවේදෝ

අලියා නොයන මග ඉනිමග නොවේදෝ

අලියා සදිසි ගල ඇතුගල නොවේදෝ

<u>කවිය</u>

නාග ලොවේ සිට මෙහි ඇවිදිල්ලා බෙල්ල කඩාගෙන ගෙයි

තව එක මිනිහෙක් ගහෙන් වැටීලා හතරට පැලිලා දොයි

ගින්නට දැවිලා වතුරට පෙඟිලා තවත් එකෙක් ගෙට එයි

මැරුණු එකෙක් විත් තිදෙනා සමගින් එකටම වී සිටිතෙයි

<u>පිළිතුර</u>

නාග ලොවින් ආ බුලත් කොළයේ නටු අග කඩලා කයි

පැහිච්ච පුවකේ ගහෙන් කඩාලා හතරට පලලා කයි

පිළිස්සු හුනුගල් උණු දිය දමලා තම්බා විටකට කයි

බුලත් විටට දුම්කොල හුනු මුසුකර රස කර කර කයි







කවිය

උඩින් දුවන වී තෝරා එවාපන්
බිමින් දුවන වී තෝරා එවාපන්
ගෙදර දුවන වී තෝරා එවාපන්
වෙල්වල තිබෙන වී තෝරා එවාපන්

පිළිතුර

උඩින් දුවන වී ගිරවී නොවේදෝ
බිමින් දුවන වී සාවී නොවේදෝ
ගෙදර සිටින වී පරවී නොවේදෝ
වෙල්වල තිබෙන වී මාව නොවේදෝ

කවිය

දාර දෙකයි එක නම මුල් කර තැනුවා
පාර තිහක් ගැසුවට බියකුත් නැතුවා
කොන් සතරයි කණු සතරයි ගෙට ඇතුවා
තෝරාකියන් ඊයේ මගදී දුටුවා

පිළිතුර

දාර දෙකයි එක මැද එක ගැවසීය
වට පිට යන කලට කනු සතරෙන් යාය
ගෙට ගිය කලට කිසි බියකුත් නැතුවාය
මට දැනෙනා ලෙසට මේ නම් ඉබ්බාය

## කවිය

මොනරෙක් සිටියි දස අත පිල් විදාගෙන
කෙනෙක් සිටියි කද මැද්දෙන් බදාගෙන
ගෙඩි කති ලෙලි කනකති හැම දෙන බෙදාගෙන
මෙතුන් පදේ තෝරනු පද හදාගෙන

## පිළිතුර

දස අත පලය කීවේ රඹ ගසය මලේ
කද මැද බදා ඉන්නේ රඹ කැනය මලේ
ලෙල්ල හැර කෙසෙල් ගෙඩි හැම කනවා  බොලේ
මෙතුන් පදය තෝරාලා කිවුවා මලේ







# පද පෙරලි

නමසලයා - සමනලයා

එවර නුළිය - නුවර එළිය

තාන්කාරය - කාන්තාරය

දෙමි කිනවා - කිමි දෙනවා

පුර පර - පර පුර

වරපෙදන - පෙරවදන

පිල ඇල්ල - ඇල පිල්ල

සැට ඇකිල්ල - ඇට සැකිල්ල

බැල් පෝය - පොල් බෑය

වත්තල පිං ගෙඩිය - පිත්තල වං ගෙඩිය

සංජු මාව - මංජුසාව

ඇස් කොට - කොස් ඇට

දඩකාසි - කඩදාසි

ගැට පිස්ම - පිට ගැස්ම

වරකල - කරවල

අට රඹ - රට අඹ

සිලීපොය - පොලීසිය



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට

යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක